රැසකුත් මෙල්බන් වල ඉන්න කීපදෙනෙකුත් මගේ ගීත එකතුවට ගායනා කරලා තියෙනවා. ඒ ගායනා කරලා තියෙන ප්‍රවීණයින් මේ පද රචනාවල යම් කිසි ප්‍රමිතියක් තිබුණෙ නැත්නම් ඒවා ගායනා කරාවි කියලා මම හිතන්නේ නෑ".

විශාරද නන්දා මාලනී, විශාරද එඩ්වඩ් ජයකොඩි, විශාරද දයාරත්න රණතුංග, විශාරද දීපිකා ප්‍රියදර්ශනී, නිරෝෂා විරාජිනි මරියසෙල් ගුණතිලක, දයාන් විතාරණ දුමාල් වර්ණකුලසූරිය මෙන්ම මෙල්බන් නුවර වසන කාන්චනා සඳමාලි, නලීන් තමෙල්, දුලිප් ජයකොඩි යන පිරිස ඉහත කී ශිල්පීන්ට අමතරව "වසන්තයයි ඔබයි,මමයි" ගී එකතුවට ගායනයෙන් දායක වී ඇත්තේය. ඊටම එක්වන විශාරද අමරසිරි පීරිස් ගායන ශිල්පියා ගැයූ ගීයක පද කීපයකි මේ,

"ආදර හසුනක් සෙමින් ඇවිල්ලා
මුමුණනවා ඔබ ගැන වදනක්
නො නිමි කවක් මා ගතේ වෙලෙනවා
පන්හිඳ අද්දර ඉකිබිඳිමින්"

"මේ වාගේ ගීත දාසයකින් යුත් "වසන්තයයි, ඔබයි,මමයි" සංගත තැටිය අපි ජුනි 14 වෙනිදා බර්වුඩ් ඊස්ට්වල කෙල්වොට්සන් ශාලාවෙදී එළිදක්වන්න අදහස් කරනවා. වික්ටර් රත්නායක කියන අපේ මහා සංගීතවේදියාණන් ගේ මූලිකත්වයෙනුයි මේ එළිදැක්වීම කෙරෙන්නේ. ඒ වාගේ විශිෂ්ඨයෙක් එදාට මා ළඟින් ඉන්න එක ඇත්තටම මට හරි හයියක්."

සමන් කුලරත්න ගී පද නිබන්ධකයා සිය කුළුදුල් ගී එකතුව එළි දැක්වීමට සහභාගී වන ලෙස සිය ප්‍රිය බිරිඳ වන කුමුදිනී ලද්දුවහෙට්ටි මහත්මිය සමගින් රසිකයින්ට මෙලෙස ඇරයුම් කරයි.

"මගේ ගීත ගැන දන්නෙ මගේ යාළුවන් විතරයි. ඒත් ගීත කීපයක් මම "යු-ටියුබ්" එකට එකතු කළා ඒවායේ හැඩරුව ගැන දැනගන්න පුළුවන් වෙන්න. ඉතින් ඒ හැඩරුව හඳුනාගෙන තව තවත් ගීත, ඒවාට ඉදිරිපත් කරන නැටුම්,ගීත වල දර්ශන වාගේ දේවල් රසවිඳින්න එදාට අපිත් එක්ක එකතු වෙන්න කියලා ආදරයෙන් හැමෝටම ආරාධනා කරනවා..."

විශාරද එඩ්වඩ් ජයකොඩි ගායනා කළ සංගත තැටියේ තේමා ගීතයේ පද කීපයක් සමගින් සමන් කුලරත්න නිර්මාණකරුවා හා පිළිසඳර නිමා වෙයි.

වසන්තයයි ඔබයි මමයි
සිත්තම් කළ සිතිජ ඉමයි
සුරංගනා ලොවක් වගෙයි
මගේ පැතුම් තව දළුලයි








